දකුණු පළාතේ 1990..... අංක..06....... දරණ

පළාත් පාලන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය.

---

පළාත් රාජ්‍ය සේවයේ සාමාජිකයන් පළාත් පාලන ආයතන වලට ලබා දීමට හැකියාව සඳහාත් ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ දකුණු පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

මේ ප්‍රඥප්තිය 1980 අංක.36, 1985 අංක.10 සහ 1987 අංක.16 දරණ පනත් වලින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක.16 දරණ පළාත් පාලන පනතට අනුකූල වේ.

(1) මේ ප්‍රඥප්තිය දකුණු පළාතේ 1990..... අංක..06.... දරණ පළාත් පාලන ආයතන (කාර්ය මණ්ඩල) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබුණු දිනක සිට එය ක්‍රියාත්මක වන්නේය.

(2) 1.(අ) පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ඉල්ලීම පිට පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු ඔහුගේ කැමැත්ත ඇතිව සහ පළාත් පාලන කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාල පරිච්ඡේදයකට පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව හෝ එවැනිම කැමැත්ත ඇතිව පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව හෝ පත් කරනු ලැබිය හැකිය.

(ආ) පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට තාවකාලිකව පත් කරනු ලැබූ විට කලින් කල සංශෝධනය කරන ලද ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක.16 දරණ පළාත් පාලන සේවා පනතේ (20)(අ) වන වගන්තියේ (2) සහ (3) වන උප වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එකී සාමාජිකයන්ට අදාල විය යුතුය.

2.(අ) පළාත් පාලන සේවයේ සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට ස්ථිරව පත්කරනු ලැබූ අවස්ථාවකදී කලින් කල සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක.16 දරණ පළාත් පාලන සේවා පනතේ (20) (අ) වන වගන්තියේ (4) උප වගන්තියේ විධිවිධාන අදාල වෙනස් කිරීම් සහිතව ඒ සාමාජිකයාට අදාල විය යුතුය.

/...2 පිටුවට.

(ආ) එවැනි සාමාජිකයකු පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ දින සිට පළාත් පාලන සේවය අතහැර ගිය තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඔහු එසේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකු වූයේ නම් 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල නියමයන් ප්‍රකාර ප්‍රදානයන් ලැබීමට ඔහුට හිමිකම් ඇත්තේය.

එසේ වුවද, එම ප්‍රදානය ඔහුට ගෙවනු ලැබිය යුත්තේ පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවා නියුක්තිය අවසාන වීමෙන් පසුව පමණකි.

(ඇ) ඉහත (2) 1 (අ) වන උප වගන්තිය යටතේ පත් කරනු ලැබූ සාමාජිකයකු එසේ පත් කරන ලද අවස්ථාවේදී පළාත් පාලන සේවයේ ස්ථිර සහ විශ්‍රාම වැටුප් හිමි තනතුරක් දරන්නකුව සිටියේ නම්, පළාත් රාජ්‍ය සේවයේ ඔහුගේ සේවය, 1975 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් නියෝගවල අර්ථානුකූලව සහ එම කාර්ය සඳහා විශ්‍රාම වැටුප් හිමි සේවයක් ලෙස සලකනු ලැබිය යුතුය.

පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ සාමාජිකයකු පිළිබඳ විනය පාලනය සහ පත් කිරීම, ඔහුගේ ස්ථාන මාරු, විශ්‍රාම ගැනීම ආදිය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාට සතු බව.

(3) පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලැබූ පළාත් පාලන සේවයේ යම් සාමාජිකයකු පත් කිරීම, මාරුකිරීම, සේවයෙන්මුදා හැරීම, විශ්‍රාම ගැන්වීම, ඔහුගේ තනතුර අහෝසි කිරීම, ඔහු ධුරයෙන් අස්කිරීම, සහ ඔහු පිළිබඳ විනය පාලනය ඒ සාමාජිකයා පළාත් රාජ්‍ය සේවයේ සේවා නියුක්තියෙහි යෙදී සිටින තාක් කල් පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරනුලැබිය යුතුය.

එසේ වුව ද එවැන්නකු පිළිබඳ විනය පාලන කටයුතු ඉහත සඳහන් පළාත් පාලන සේවා පනතේ 23 වන වගන්තියේ (1) වන උප වගන්ති යටතේ සාදනු ලැබූනියෝග වලට අනුකූල විය යුතුය.

(4) 1. පළාත් රාජ්‍ය සේවයට පත් කරනුලැබූනිලධරයකුගේ සේවය පළාත තුළ පිහිටි යම් පළාත් පාලන ආයතනයක් විසින් ඉල්ලා සිටිනු ලැබූ විටක පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසුයයි සලකනු ලබන කාල පරිච්ඡේදයකට එවැනි පළාත් පාලන ආයතනයකට ලබා දිය හැකිය යන්න එසේ පළාත් රාජ්‍ය සේවයට පත් කරනු ලබන සෑම නිලධරයකු සම්බන්ධයෙන්ම නියමයක් සහ කොන්දේසියක් වන්නේය.

2. ඉහත 1 වන උපවගන්තිය යටතේ පළාත් රාජ්‍ය සේවයේ නිලධරය ගේ සේවය පළාත්පාලන ආයතනයට ලබා දුන් අවස්ථාවකදී පළාත් රාජ්‍ය සේවයේ වෙනත්යම්නිලධරයකුට අදාළ වන විනය පාලනයටම ඔහු යටත් වන්නේය.